00062

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනපති උපාධි වැඩසටහන

අවසාන පරීක්ෂණය -2018/ 2019

**STP 9811 /ESP2311-** අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම

කාලය - පැය තුන (03) යි.

---

දිනය : 2019.03.16 වේලාව : පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

01. "ක්‍රියාවලි කිහිපයක් සම්බන්ධ වන බැවින් ළමයෙකුගේ සංවර්ධනය ඉතාමත් සංකීර්ණය."

(i) ළමයෙකුගේ සංවර්ධනය හා සම්බන්ධ ක්‍රියාවලි දෙකක් (02) ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(ii) බැන්ඩූරාගේ සමාජ ඉගෙනුම් න්‍යායයේ ප්‍රධාන මූලධර්ම පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

(iii) බැන්ඩූරා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රධාන මූලධර්මවලට අදාලව ළමයෙකුගේ සංවර්ධනය සම්බන්ධයෙන් ගුරුවරයාගේ භූමිකාව පරීක්ෂා කරන්න. (ලකුණු 10 යි.)

02. (i) 'ආයු කාල සංවර්ධනයේ විවිධත්වය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? නිදසුනක් යොදාගෙන පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(ii) එරික්සන්ගේ ආයුකාල සංවර්ධනය පිළිබඳ මනෝ-සමාජ න්‍යායයෙහි මූලධර්ම දෙකක් **(02)** පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

(iii) පන්ති කාමරයේ සිසුන්ගේ සංවර්ධනයේ විවිධත්වය තේරුම් ගැනීමට එරික්සන්ගේ මනෝ-සමාජ න්‍යායයෙහි ප්‍රයෝජනවත් බව සාකච්ඡා කරන්න. (ලකුණු 10 යි.)

03. (i) හොවාර්ඩ් ගාර්ඩ්නර් ගේ අදහස්වලට අදාලව 'බුද්ධිය' යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 05 යි.)

(ii) (අ) හොවාර්ඩ් ගාර්ඩ්නර් විසින් හඳුන්වා දෙන ලද බහුවිධ බුද්ධීන් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) ඉගෙනීම්-ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී කර ගැනීමට ගුරුවරයෙකුට බහුවිධ බුද්ධීන්වල භාවිතයන් නිදසුන් සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

(iii) පන්තිකාමරයේ සිසුන් සමඟ බහුවිධ බුද්ධීන් භාවිත කිරීමේ දී ගුරුවරුන් මුහුණ දෙන ගැටලු හතරක් **(04)** පරීක්ෂා කරන්න. (ලකුණු 10 යි.)

04. (i) මැල්කම් නෝල්ස් පැහැදිලි කරන අන්දමට වැඩිහිටි අධ්‍යාපිතයන්ගේ චර්යා ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(ii) ඔබගේ පාසලේ ගුරුවරුන් වැඩිහිටි අධ්‍යාපිතයන් කණ්ඩායමක් ලෙස සලකා ඉහතින් දක්වන ලද චර්යා ලක්ෂණ කොතරම් දුරට ඔවුන් වෙතින් ප්‍රදර්ශනය වන්නේ දැයි පරීක්ෂා කරන්න. අවශ්‍ය තැන්හිදී නිදසුන් යොදා ගන්න. (ලකුණු 07 යි.)

(iii) ඔබගේ පාසලේ ගුරුවරුන්ට ගැලපෙන මාතෘකාවක්/තේමාවක් තෝරා ගන්න. එම ගුරුවරුන්ගේ චර්යා ලක්ෂණවලට ගැලපෙන ඉගැන්වීම්-ඉගෙනුම් ක්‍රියාමාර්ග තෝරා ගනිමින් එම තේමාව ආවරණය කිරීමට සැසියක් පවත්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 12 යි.)

05. යෞවනවියේ සමායෝගය ඔවුන්ගේ පසුකාලීන සංවර්ධනය කෙරෙහි බලපෑම් ඇති කරනු පමණක් නොව පොදුවේ සමාජයෙහි සෞඛ්‍යය කෙරෙහි බලපායි.

(i) පිළිගත් නිර්වචන දෙකක් ඇසුරෙන් යෞවන විය නිර්වචනය කරන්න. (ලකුණු 05 යි.)

(ii) යෞවනයන්ගේ සංවර්ධනයට අදාලව පහත දක්වන පර්යාලෝකයන් සංසන්දනය කරන්න. (ලකුණු 10 යි.)

(අ) විශ්වීය - සංසයන පර්යාලෝකය

(ආ) සංස්කෘතික - සන්දර්භ පර්යාලෝකය

(iii) වර්තමාන ශ්‍රී ලාංකික සමාජ සන්දර්භයෙන් මතුවන අභියෝගවලට මුහුණදීම සඳහා යෞවනයින් තුළ මූලික හා මෘදු කුසලතා සංවර්ධනය කිරීමේදී ගුරුවරයාගේ සහ සමාජයෙහි බලපෑම පරීක්ෂා කරන්න. (ලකුණු 10 යි.)

06. (i) 'ප්‍රජානන ක්‍රියාවලීන්' යන යෙදුම කෙටියෙන් පැහැදිලි කරන්න.(ලකුණු 05 යි.)

(ii) තොරතුරු සැකසුම් න්‍යායයෙහි ගානේ පැහැදිලි කරන ලද ආකාරයට ඉගෙනුමෙහි ප්‍රධාන ක්‍රියාවලීන් පහ **(05)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

(iii) සිසුන්ට උපදේශන ක්‍රියාමාර්ග සැලසුම් කිරීමේ දී ඉගෙනුම් පිළිබඳ තොරතුරු සැකසුම් න්‍යායයෙහි භාවිතයන් පරීක්ෂා කරන්න. (ලකුණු 10 යි.)

07. " ශාස්ත්‍රීය සාධනයෙහි ජයග්‍රහණය හා පරාජය සාධක ගණනාවක් මත රඳයි."

(i) 'සාධන අභිප්‍රේරණය' (Achievement motivation) යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(ii) ජෝන් ඇට්කින්සන් විසින් ඉදිරිපත් කළ සාධන අභිප්‍රේරණය පිළිබඳ න්‍යායයෙහි ප්‍රධාන මූලධර්ම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

(iii) සිසුන් තුළ පරාජය පිළිබඳ බිය මඟහැරීමට ගුරුවරයෙකුට යොදාගත හැකි පෙළඹවීම් ක්‍රියාමාර්ග හතරක් **(04)** විශ්ලේෂණය කරන්න. (ලකුණු 10 යි.)

හිමිකම් ඇවිරිණි.